සැ. යු. - (i) මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2010 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් පළ වේ.

(iii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ ශ්‍රී ලංකාවේ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,821 - 2013 ජූලි මස 26 වැනි සිකුරාදා - 2013.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1134 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1135 |


සැ. යු.- (i) මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2013 අගෝස්තු මස 16 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2013 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අගෝස්තු මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජූලි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | මාතලේ | මාතලේ නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය | මාතලේ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

07-827

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර — මොණරාගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අගෝස්තු මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජූලි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මොණරාගල | වැල්ලවාය | වැල්ලවාය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැල්ලවාය කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල. |

07-828

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන අංක 1070/13-1999 මාර්තු මස 11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත. :-

නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථාවල දී හෝ පෙනී සිටිය හැක.

(අ) විෂය නිර්දේශය :

| *විෂය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | *සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු :* රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx හා xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති | 100 යි | පැය 1 1/2 |
| 02 | *මුදල් රෙගුලාසි :* රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ i, ii, v, viii, xii, හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව | 100 යි | පැය 1 1/2 |
| 03 | *අධ්‍යාපන නීතිය :* අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ. | 100 යි | පැය 2 |

(i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි
(ii) 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත
(iii) 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත
(iv) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(v) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත
(vi) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(vii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(viii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(ix) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත
(x) 13 වැනි සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xi) අධ්‍යාපනයට අදාළව පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

*සැ. යු.-* අපේක්ෂකයින් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40%ක් බැගින් වූ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

03. විභාගයේ භාෂා මාධ්‍යය :

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ii) තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයද, තරග විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම්පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම් පත්‍රයේ සියළුම ශීර්ෂයන් පළමුවැනි පිටුවට වන ලෙස ගෙන සකසා ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍ර දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම්පත්‍ර 2013 වර්ෂයේ අගෝස්තු මස 19 වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම්පත්‍රයක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින්

පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, අයදුම්පත තැපැල්කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ද, ෆැක්ස් මගින් යොමු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

11. විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර, ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් කුමක් වුවත් වලංගු වේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතු ය.

(i) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ii) සම්පූර්ණ විභාග ගාස්තු රු. 450 කි.
එක් විෂයයකට රු. 150 කි.

විභාග ගාස්තුව "විභාග කොමසාරිස් ජනරාල්" ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට" බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයෙන් අලවන්න. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

14. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලැබේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 ජූලි මස 12 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## ඉල්ලුම්පත්‍රය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013
Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service - 2013

ඉල්ලුම්පත්‍ර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. (විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙලවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4

(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA, A. B.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3. (අ) පදවි නාමය :—————.
(ආ) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාල/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.) :————.

4. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

5. නිවේදනයේ දෙවැනි ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

| විෂයය අංකය | විෂයයේ නම |
|---|---|
| | |
| | |
| | |

6. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද, එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| විෂයය | වර්ෂය | මාධ්‍යය | විභාග අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |

7. ගෙවන ලද විභාග ගාස්තු :-

විභාග ගාස්තු ගෙවා ලදු පත මෙහි අලවන්න.

8. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි. අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
පීඨාධිපතිගේ/ගුරු මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය.

දිනය :————.

07-853

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

හෙද සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2013

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද සේවාවේ පහත සඳහන් පාඨමාලාව සඳහා ජාතික විශ්වවිද්‍යාල මඟින් විද්‍යාවේදී හෙද උපාධිය ලබාගත් උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශ යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කර ගෙන සිදුකරනු ලබයි.

1. අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට පෙනී සිටිය යුතු අතර ලිඛිත තරග විභාගයේ කුසලතාවය අනුව හා පවතින පුරප්පාඩු අනුව බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කරනු ලැබේ. මේ වන විට කොන්ත්‍රාත් පදනම මත අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකයේ සේවයේ නියුක්ත කර තිබෙන හෙද උපාධිධාරීන් අතරින් අයදුම්පත් පියවන දින වන තෙක් අඛණ්ඩව සේවයේ යෙදී සිටින හෙද නිලධාරීන් ලිඛිත තරග විභාගයට පෙනී සිටීම අවශ්‍යය නොවේ. ඔවුන් ප්‍රමුඛතා පදනම මත මෙම ගැසට් පත්‍රයේ විධිවිධානවලට යටත්ව බඳවා ගනු ඇත.

2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-

විද්‍යාවේදී හෙද (Bsc. Nursing) උපාධිය සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. අනෙකුත් පොදු සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ආ) 2013.08.26 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.

(ඇ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු ය.

(ඈ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තවීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතු ය.

(ඉ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය.

(ඊ) උස අඩි 4යි අඟල් 10ට නොඅඩු විය යුතු ය.

4. ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය

අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණ ගැටළු අඩංගු පැය 01ක බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු ය.

5. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතු ය. අයදුම්පතේ 1 සිට 09 දක්වා පළමු පිටුවේ ද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය.

(ආ) එක් අයදුම්පතක් සඳහා අයදුම්පතේ 'මුද්දර' යන ස්ථානයේ රු. 300 ක මුද්දර නොගැලවෙන සේ අලවා තම අත්සන ඒ මත යොදා එය අවලංගු කළ යුතු ය.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

(ඉ) හෙද පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද පුහුණුව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම-2013" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ පාලන 01, සෞඛ්‍ය අමාත්‍යාංශය, 'සුවසිරිපාය', අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2013.08.26 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ඊ) මේ වන විට කොන්ත්‍රාත් පදනම මත සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකයේ සේවයේ යොදවා ඇති හෙද උපාධිධාරීන් අතුරින් අයදුම්පත් පියවන දිනය වනතෙක් අඛණ්ඩව සේවයේ යෙදී සිටින හෙද උපාධිධාරීන් ස්ථිර පත්වීමක් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් මෙම ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි වලට යටත්ව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. ඔවුන් අයදුම්පත් සමඟ අයදුම්පත් පියවන දින තෙක් අදාළ රෝහලේ සේවයේ යෙදී සිටි බවට ආයතන ප්‍රධානියාගෙන් සේවා සහතිකයක් ලබා ගෙන එය ද අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

6. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට

හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතු ය.

7. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

8. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාල අකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු කුසලතාවය මත සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛණයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය);

(*ඇ*) අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උ.පෙළ) විභාග ප්‍රථිපල දැක්වෙන සහතිකයේ මුල් පිටපත;

(*ඈ*) ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතුය.);

(*ඉ*) ඉහත 5(ඈ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය);

(*ඊ*) අයදුම්පත් පියවන දින තෙක් අඛණ්ඩව සේවය කළ බවට සේවා සහතිකය (අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකයේ සේවයේ නියුතු නිලධාරීන් පමණි).

11. *පුහුණු කිරීමේ පරිපාටිය :*

| *පාඨමාලාව* | *එම පාඨමාලාවේ කාලසීමාව* | *එම පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|
| හෙද පුහුණු පාඨමාලාව | මාස 06 | ඉංග්‍රීසි |

(i) තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාල අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල් වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

(ii) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල් වල බල පැවැත්වෙන නීති රීති වලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝග වලටද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුලත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(iv) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුල දී අභ්‍යාසලාභීන්ට/අභ්‍යාසලාභිනියන්ට රු. 12,920 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ හයක (06) කාලපරිච්ඡේදයක් අදාල පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාල තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුලදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ හයක (06) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අදාල තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුලදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

12. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

පුහුණුව අවසානයේ අදාල තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාල තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) හි එම්. ටී. 7/2006(ඒ) පරිදි රු. 15,620 - 4 x 180-6x240-11x320-20x360-රු. 28,500 ක වැටුප් පරිමාණය මත III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ.

13. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුලදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාල මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

14. තෝරාගත් අයදුම්කරුවන් අදාල පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

15. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙන රජයේ සේවකයින්ට අදාල වන සියළුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්ති වලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසි වලටද, රජය වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත් වනු ඇත.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

17. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

හෙද සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2013

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න

* අයදුම් කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්)
* අයදුම් කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්)

1. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - උදා : A. B. C. SILVA
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)

2. ජාතික හැඳුනුම්පත් අංකය (පිටපතක් අමුණන්න) :

☐☐☐☐☐☐☐☐☐☐

3. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
________. ________.
________. ________.
________. ________.
________. ________.

4. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
________. ________.
________. ________.
________. ________.
________. ________.

(ආ) දුරකථන අංක :

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද?
ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :————.

5. උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.
2013.08.26 දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග : ඔව් - ☐ නැත - ☐
(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව : විවාහක - ☐ අවිවාහක - ☐

9. උස : අඩි :————. අඟල් :————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

| # | සමත් වූ උපාධිය | සාමාර්ථය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය ( GPA) | විශ්ව විද්‍යාලය | අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ?
ඔව් ☐ නැත ☐
(අදාල කොටුවේ ලකුණ ✓ යොදන්න)
ඔව් නම් විස්තර සපයන්න :————.

12. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියළු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිඳු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බවද මම දැන සිටිමි.

(ඇ) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ

නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

| මුද්දර<br>රු. 300 |
|---|

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................... මයා./මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය ..................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

————,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

14. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාල නොවන වචන කපා හරින්න) ඃ

(i) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ..................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ........... තනතුරේ දරන බව මින් සහතික කරමි.

(ii) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

(iii) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

07-823

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1225/32 දරන 2002.03.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

*විභාග පරිපාටිය ඃ*

(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ ඃ-

| | | |
|---|---|---|
| විෂයය අංකය | 01 | සාමාන්‍ය පරිපාලනය - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආයතන සංග්‍රහයේ විධිවිධාන රජයේ වෙනත් රෙගුලාසි; |
| විෂයය අංකය | 02 | මුදල්; |
| විෂයය අංකය | 03 | අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය; |

(ආ) නිලධාරියකුට I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැකි ය;

(ඇ) සෑම ප්‍රශ්න පත්‍රයකට ම කාලය පැය 03 යි.

03. විෂයය නිර්දේශය

(01) සාමාන්‍ය පරිපාලනය-

(අ) ලංකා (ආණ්ඩුක්‍රම) රාජ ආඥාව 1946 හා 1947 (973 වන පරිච්ඡේදය)
1948 අංක 18 පුරවැසි පනත (349 වැනි පරිච්ඡේදය)
1972 මැයි 22 දින පනවා සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත
1981 අංක 19 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
1981 අංක 07 දරන ජනමත විචාරණ පනත
1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව;

(ආ) කාර්යාලයීය සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම
ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රජයේ වෙනත් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පරිච්ඡේද

I, II, III, IV, V, VI, VII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII.

(02) මුදල්-

(අ) රජයේ මුදල් රෙගුලාසි 1 වන කොටස (1 වන පරිච්ඡේදය හැර);

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තු උදා.-ඒවායේ සැකැස්ම, ආදායම්, ශීර්ෂ, මුදල් හා විසර්ජන පනත්;

(ඇ) අධ්‍යාපන කාර්යාල මගින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළවන ආඥාපනත් සහ වෙනත් නීති ප්‍රඥප්ති.

(03) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය-

(අ) අධ්‍යාපන නීතිය.-අපේක්ෂකයන් පහත සඳහන් ආඥා පනත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතු ය.:-

* 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත;
* 1947 අංක 26 දරන සංශෝධන ආඥාපනත;
* 1951 අංක 05 දරන සංශෝධන පනත;
* 1953 අංක 43 දරන සංශෝධන පනත;
* රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය;
* 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරුවිද්‍යාල (විශේෂ විධිවිධාන - සංශෝධන) පනත;
* 1961 අංක 08 දරන උපකෘත පාසල් හා ගුරුවිද්‍යාල (අතිරේක විධිවිධාන) පනත;
* 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත;
* 1979 අංක 64 දරන පිරිවෙන් පනත;
* 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන - සංශෝධන පනත);
* 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත.

(ආ) අධ්‍යාපන පරිපාලනය-

(1) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති-

(i) අධ්‍යාපන අමාත්‍යාංශය;

(ii) දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්;

(iii) ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් අධ්‍යාපනික සැලසුම් කිරීම, පරමාර්ථ ක්‍රම (පාසල් සැකසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය;

(2) පාසල් කළමනාකරණය, පාසල් ප්‍රජා සම්බන්ධතා;

(3) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය;

(4) විශේෂ අධ්‍යාපන වැඩසටහන්.

(ඇ) *අධ්‍යාපන අධීක්ෂණය-*

* පාසල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන;
* පාසල්වල අඛණ්ඩ ඇගයීම් වැඩසටහන්;
* පාසල්වල ස්වයං ඇගයීම් වැඩසටහන්;
* දිස්ත්‍රික්, දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම;
* බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය.

*(අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)*

*නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන :*

* අධ්‍යාපන සැලසුම් හා පරිපාලනය පිළිබඳ ආසියාතික ආයතන (1970);
* අධ්‍යාපන පරිපාලනය පිළිබඳ නව කළමනාකරණ ශිල්පීය ක්‍රම;
* සම්මන්ත්‍රණයක වාර්තාවක් - නවදිල්ලිය;
* බැරි සහ ටයි (1975) පාසලක් පවත්වාගෙන යාම ටෙම්පල් ස්මිත් ලන්ඩන්;
* බුෂ් ටී ග්ලැටර් ආර්. ගුඩ් සහ සී. රිවස් (1980) පාසල්;
* කළමනාකරණ විධි, හාර්පර් සහ රෝ;
* ආචාර්ය කාන් මොහිදීන් ෂෙරීෆ් 1983;
* පාසල් පරිපාලනය - නවදිල්ලිය;
* අධ්‍යාපන අමාත්‍යාංශය ලංකාවේ අධ්‍යාපනය (1969)
* අධ්‍යාපන හා සංස්කෘතික වැඩ කටයුතු අමාත්‍යාංශයේ ශත සංවත්සරික කාණ්ඩය II වන හා III වන කොටස්:
* විවෘත විශ්වවිද්‍යාලය (1981) පාසල්වල ප්‍රතිපත්ති සම්පාදනය සංවිධානය හා නායකත්වය (ඊ 323 පාඨමාලාවේ 4 වන කොටස) විවෘත විශ්වවිද්‍යාලය, යුනිවර්සිටි ප්‍රෙස්, ලන්ඩන්, ෂිප්මන්, මර්ටන් (1983) පාසලෙහිම ඇගයීම හයිස්මන් අධ්‍යාපන පොත් ලන්ඩන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තාව - 1984.

04. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 100කි. සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයයට 40%ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු ය.

05. *විභාගයේ භාෂා මාධ්‍යය :*

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ;

(ii) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එක් මාධ්‍යයකින් පිළිතුරු ලිවිය හැක;

(iii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

06. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියක ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පතෙහි අංක 01 සිට 05 තෙක් ඡේදයන් පළමු වන පිටුවෙහිත් ඉතිරිය දෙවන පිටුවෙහිත් සඳහන් කරන්න.) සිංහල අයැදුම්පත්‍රයේ විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයැදුම්පත්‍රයේ විභාගයේ නම දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන

අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවද සලකන්න.

08. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

09. ඉල්ලුම්පත්‍ර 2013.08.26 දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම ද සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2/3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමග ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායි වනු ඇත. (ෆැක්ස් අංකය 011-2784232) ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන්න.

(i) විභාගයේ නම :————.
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය හා තැපැල් කාර්යාලය :————.

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

12. (i) සෑම අපේක්ෂකයෙකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාගය ආරම්භ වන දිනයේ විභාගශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාගශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම් වන අතර ඒ සඳහා පුද්ගලයින් ලියාපදංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදෙස් ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. අදාල විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(අ) පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.)

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා-

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | රු. 1,000 0 යි |
| එක් විෂයයකට | රු. 500 0 යි |

14. (i) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 ජූනි මස 28 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ඉල්ලුම් පත්‍රය**

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013**

First Efficiency Bar Examination for Officers in Class III of the Sri Lanka Education Administrative Service - 2013

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ෘ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

01. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ෑ- උදා.- SILVA S. A.
:————.

(ආ) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ලිපිනය ෘ
(i) රාජකාරි ලිපිනය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iv) දුරකථන අංකය :————.

03. නිවේදනයේ 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

විෂය අංකය :- ☐☐ විෂයය :-

විෂය අංකය :- ☐☐ විෂයය :-

විෂය අංකය :- ☐☐ විෂයය :-

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. (i) පදවි නාමය :————.

(ii) දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය/පාසල :————.

07. මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය, විෂයය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *වර්ෂය* | *විෂයය* | *මාධ්‍යය* |
|---|---|---|
| ————. | ————. | ————. |
| ————. | ————. | ————. |
| ————. | ————. | ————. |

08. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 06 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලුම නීති රීතිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළඟ තබා ගන්න. අදාළ නම් පමණි) |

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, 06 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බව ද ප්‍රකාශ කරමි. (*)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව.

දිනය :————.

*ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.

07-710

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.